# මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
# நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சு
# MINISTRY OF FINANCE, PLANNING AND ECONOMIC DEVELOPMENT

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව | செயலகம், கொழும்பு 01. இலங்கை. | The Secretariat, Colombo 01. Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011 - 2484500, 011 - 2484600, 011 - 2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 - 2449823
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல. / My No.: BD/CBP/01/01/40/2024
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2024.12 24

**අයවැය චක්‍රලේඛ අංක : 05/2024**

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
රාජ්‍ය සංස්ථා/විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව/ව්‍යවස්ථාපිත මණ්ඩල සභාපතිවරුන්

**2025 අතුරු සම්මත ගිණුම අනුව වියදම් දැරීම සඳහා බලය දීම**

2025 වර්ෂය වෙනුවෙන් විසර්ජන පනතක් සම්මත කරගන්නා තෙක් 2025 වර්ෂයේ මුල් මාස 04ක කාලය සඳහා රජයේ වියදම් පියවා ගැනීමට අවශ්‍ය වන අයවැය ප්‍රතිපාදන ඇතුළත් කරමින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද අතුරු සම්මත ගිණුම (Vote on Account) 2024-12-06 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කර තිබේ.

**02.** අතුරු සම්මත ගිණුම මඟින් සම්මත කරන ලද ප්‍රතිපාදන යොදා ගෙන වියදම් දැරීමට හැකිවන පරිදි නියමිත වොරන්ට් බලපත්‍ර වලට ගරු මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා විසින් අත්සන් තබා ඇත. ඒ අනුව, ගෙවීම් වවුචර් සහ අනෙකුත් අදාළ ලියකියවිලිවල සඳහන් කළ යුතු බලපත්‍ර අංක පහත පරිදි වේ.

| | | |
|---|---|---|
| 2025 අංක 1 දරණ බලපත්‍රය (අතුරු සම්මත ගිණුම) | - | පොදු සේවා සඳහා |
| 2025 අංක 1 දරණ විශේෂ නීති සේවා අධිකාරි බලපත්‍රය (අතුරු සම්මත ගිණුම) | - | විශේෂ නීති සේවා කටයුතු සඳහා |
| 2025 අංක 1 දරණ අත්තිකාරම් බලපත්‍රය (අතුරු සම්මත ගිණුම) | - | අත්තිකාරම් ගිණුම් කටයුතු සඳහා |

**03.** ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් ඒ ඒ ආයතනයට අදාළ වැය විෂයයන් පිළිබඳ විස්තරාත්මක වියදම් ඇස්තමේන්තු ඉදිරියේ දී ඔබ වෙත ලබා දෙනු ඇත.

**04.** අතුරු සම්මත ගිණුමට අදාළ විස්තරාත්මක අයවැය ඇස්තමේන්තු මේ වන විට ITMIS පද්ධතියට ද ඇතුළත් කර ඇති අතර අතුරු සම්මත ගිණුම බලාත්මක වන කාලය තුළ ඒ ඒ ආයතනවල වියදම් දැරීම එම ඇස්තමේන්තුවල දැක්වෙන සීමාවන්ට අනුකූලව සිදු කළ යුතු ය.

**05.** මේ සමඟ අමුණා ඇති උපලේඛන 01 හා 02 මඟින් පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද වියදම් සීමාවන් සහ අත්තිකාරම් ගිණුම් සීමාවන් දක්වා ඇත.

**06.** රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් “බී“ ගිණුම යටතේ ණය පහසුකම් සැලසීමේ දී උත්සව අත්තිකාරම් හා විශේෂ අත්තිකාරම් සඳහා ප්‍රමුඛතාවය ලබා දිය යුතු ය. සියලුම නිලධාරීන් සඳහා උත්සව අත්තිකාරම් හා විශේෂ අත්තිකාරම් ලබා දීමට ප්‍රතිපාදන වෙන්කිරීමෙන් අනතුරුව තවදුරටත් වියදම් සීමාවෙහි ඉතිරියක් පවතී නම් පමණක් ආපදා ණය ලබාදීම කළ හැකි ය.

**07.** උපලේඛන 1 හා 2 ට අදාළව ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් ඔබ වෙත සපයනු ලබන විස්තරාත්මක ඇස්තමේන්තු ද පදනම් කරගෙන අතුරු සම්මත ගිණුම ක්‍රියාත්මක වන කාලය තුළ අවශ්‍ය අක්මුදල් නිදහස් කිරීමට භාණ්ඩාගාරය විසින් කටයුතු කරනු ඇත.මෙම ක්‍රියාවලිය තුළ 2025 මුල් මාස 04 සඳහා අක්මුදල් සීමාව ගණනය කළ යුතු ආකාරය පිළිබඳ උපදෙස් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් ඉදිරියේ දී ලබාදීමට කටයුතු කරනු ඇත.

**08**. අතුරු සම්මත ගිණුමෙන් වියදම් දැරීමට අවසර ලැබෙනුයේ 2024 වර්ෂයේ ඇස්තමේන්තුවල ඇතුළත් වූ 2025 වර්ෂය සඳහා තවදුරටත් පවත්වාගෙන යා යුතු වැඩසටහන්, ව්‍යාපෘති හා විෂයයන් සඳහා පමණි.කෙසේ වෙතත් අතුරු සම්මත ගිණුමේ ඇතුළත් වාර්ෂික සංවර්ධන වැඩසටහන්වල කායීයන්, රජයේ සංවර්ධන ප්‍රමුඛතාවයන්ට අනුකූලවන පරිදි ක්‍රියාත්මක කිරීම පිළිබඳ ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විමසා තහවුරු කර ගැනීමට කටයුතු කළ යුතු වේ. අතුරු සම්මත ගිණුම ක්‍රියාත්මක වන කාලය තුළ නව කාර්යයන් සම්බන්ධයෙන් බැඳීම් ඇති කර නොගත යුතු ය.

**09**. අතුරු සම්මත ගිණුම තුළ සම්පූර්ණ ප්‍රතිපාදන ඇතුළත් නොවුව ද නියමිත අනුමැතිය ලබාගෙන ඇති දැනට ක්‍රියාත්මක වන ව්‍යාපෘති නියමිත කාලය තුළ නිම කිරීමට හැකිවන පරිදි ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කිරීම හා අනෙකුත් ව්‍යාපෘති කාර්යයන් සිදු කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදු කිරීමට බාධාවක් නොවිය යුතු ය.

**10**. එසේම, රාජ්‍ය ආයතනවල වියදම් දැරීමේ දී අරපිරිමැසුම්දායි හා නාස්තිය අවම වන අයුරින් කටයුතු කිරීම සම්බන්ධයෙන් මේ වන විට බලාත්මක විධිවිධාන කෙරෙහි සියලු ආයතන ප්‍රධානීන් තම පෞද්ගලික අවධානය යොමු කළ යුතු වේ.

**කේ.එම්.මහින්ද සිරිවර්ධන**
**භාණ්ඩාගාර ලේකම්**

පිටපත් :(i). ජනාධිපති ලේකම්
(ii). අග්‍රාමාත්‍ය ලේකම්
(iii). අමාත්‍ය මණ්ඩලයේ ලේකම්
(iv). විගණකාධිපති
(v). ලේකම්, මුදල් කොමිෂන් සභාව